# ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

## රැකියා අවස්ථා

දිවයින පුරා ශාඛා 272 කින් යුත් ජාලයකින් සහ 3,000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත විශිෂ්ඨ නායකත්ව හැකියාවකින් යුත් පළපුරුදු වෘත්තිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ප්‍රධාන කළමනාකරු - තොරතුරු පද්ධති විගණන

__මූලික සුදුසුකම්__

1. පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණ හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමඟ තොරතුරු පද්ධති විගණනය (*IS Auditing*) පිළිබඳ අවම වසර 03 ක සුපරීක්ෂණ මට්ටමේ පළපුරුද්දක් ඇතුළුව වසර 07 ක අවම පළපුරුද්දක් ලබා තිබීම. (බැංකු ක්ෂේත්‍රයේ වඩාත් සුදුසු වේ)
   හෝ
   පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් තොරතුරු තාක්ෂණ හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් /පශ්චාත් උපාධි සුදුසුකමක් සමඟ තොරතුරු පද්ධති විගණනය (*IS Auditing*) පිළිබඳ අවම වසර 02 ක සුපරීක්ෂණ මට්ටමේ පළපුරුද්දක් ඇතුළුව වසර 05 ක අවම පළපුරුද්දක් ලබා තිබීම. (බැංකු ක්ෂේත්‍රයේ වඩාත් සුදුසු වේ)

2. *CISA* හෝ *CISM* වෘත්තීය සහතිකය ලබා තිබීම අත්‍යවශ්‍ය වන අතර *CCNA* සුදුසුකම විකල්ප වශයෙන් තිබිය හැක.
3. *Scripting Language* පිළිබඳ අත්දැකීම් තිබීම වාසි සහගත වේ.
4. ලිඛිත සහ වාචික සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ කුසලතා සහිත වීම. ඉදිරිපත් කිරීමේ හැකියාව සහිත වීම.
5. තොරතුරු තාක්ෂණ මෙහෙයුම් ක්‍රියාවලි/ තොරතුරු පද්ධති සහ තොරතුරු ආරක්ෂණ පාලනය පිළිබඳ මනා දැනුම
6. මනා කළමනාකරණ කුසලතාව සහ සහයෝගයෙන් වැඩ කිරීමේ හැකියාව
7. වයස අවු. 50ට අඩු වීම සුදුසුය.

__ප්‍රතිලාභ__

සුදුසුම අපේක්ෂකයා ආකර්ෂණීය දීමනාවක් සහිත වැටුපකට හිමිකම් කියනු ලබයි.

__අයදුම් කළ යුතු ආකාරය__

තමා පිළිබඳ ව විමසිය හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ තොරතුරු සහිතව තම ජීව දත්ත තොරතුරු ඇතුලත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026 අගෝස්තු මස 30** දින හෝ ඊට පෙර *careers@rdb.lk* විද්‍යුත් ලිපිනයට යොමු කරන්න. එහි විෂය (*Subject*) හිරයේ අයදුම්කරනු ලබන අදාළ තනතුර සඳහන් කරන්න.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රධාන මානව සම්පත් නිලධාරී
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
අංක 933, නුවර පාර
වෙදමුල්ල, කැළණිය

SINCE 2014
Gazette.lk
AMBITIONS REALIZED

HOTLINE 24x7
1985
www.rdb.lk

RDB බැංකුව
Empowering Sri Lankans

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි.
| "BBB" "Stable (LRA)